2025.01.01 ලංකාදීප F 9.

# කොළඹ උද්ධමනය ඉහළ නගී

රංජන් කස්තුරි

කොළඹ නාගරික ප්‍රජාවගේ පාරිභෝගික උද්ධමන අනුපාතය දෙසැම්බර් මාසයේදී සියයට - 1.7 ක් දක්වා වැඩි වී ඇතැයි ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සඳහන් කරයි. නොවැම්බර් මාසයේදී එය වාර්තා වී තිබුණේ සියයට -2.1 ක් ලෙසය.

දෙසැම්බර් මාසයේ දී ආහාර කාණ්ඩයේ උද්ධමනයද (ලක්ෂ්‍යමය) සියයට 0.8 දක්වා වැඩි වී ඇති අතර නොවැම්බර් මාසයේ දී එය වාර්තා වූයේ සියයට 0.6 ක් ලෙසයි.

තවද ,දෙසැම්බර් මාසය සඳහා ආහාර නොවන කාණ්ඩයේ උද්ධමනය (ලක්ෂ්‍යමය) සියයට -3.0 ක් දක්වා වැඩි වී ඇති අතර එය නොවැම්බර් මාසයේ දී සියයට -3.3 ක් ලෙස වාර්තා විය.